# සාරාංශය

ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂයයට අදාළ ව පරිණාමන ගුරු භූමිකාව විමසීම මෙම පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ප්‍රායෝගික හා තාක්ෂණික විෂයයන් සමාජ හා පොදු කුසලතා වර්ධනයෙහි ලා බෙහෙවින් වැදගත් වේ. කුසලතා හා නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ගුරු භූමිකාව බෙහෙවින් වැදගත් වේ. ප්‍රා.තා.කු. විෂයය පද්ධතියට හඳුන්වා දීමෙන් අපේක්ෂිත කුසලතා හා නිපුණතා සිසුනට අත්පත් කර දීමේ දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පරිණාමන ගුරු භූමිකාව ක්‍රියාත්මක කිරීම තුළ ගුරුවරුන් විවිධ අභියෝගයනට/ගැටලුවලට මුහුණ දේ. ගුරුවරුන් මුහුණ දෙන එම ගැටලු මොනවා ද? එම ගැටලු විසඳා ගැනීමට ගුරුවරුනට දිය හැකි සහයෝගය, එම සහයෝගය දෙන ආකාරය පිළිබඳ පර්යේෂිකාව අධ්‍යයන අරමුණුවලට අනුව සහයෝගී ඉගැන්වීමක් යටතේ සොයා බැලිණි. ඊට අමතරව පරිණාමන ගුරු භූමිකාව පිළිබඳ දැනුවත් භාවයත්, විෂයය හා ගුරු භූමිකාව ක්‍රියාත්මක කිරීමට ලැබෙන විදුහල්පති හා ගුරු උපදේශන සහයත් ප්‍රා.තා.කු. විෂයයන්වල ඓතිහාසික පසුබිමත් පිළිබඳ ව විමසා බැලුණි.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා පර්යේෂණ පිරි සැලසුමක් ලෙස බහු ප්‍රත්‍යෙක අධ්‍යයන ක්‍රමය භාවිත කරන ලදි. කොළඹ අධ්‍යාපන කලාපයේ බොරැල්ල අධ්‍යාපන කොට්ඨාසයේ ජාතික පාසල් 1ඒබී, 1සී, හා 2 වර්ගයේ පාසල් 5ක් තෝරා ගැනිණි. එම පාසල්වල විදුහල්පතිවරුන් හා කොට්ඨාසයේ ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා උපදේශකවරු තිදෙනකු හා එක් පාසලකින් 7 ශ්‍රේණියේ ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂයය උගන්වන ගුරුවරුන් දෙදෙනා බැගින් ගුරුවරුන් 10 දෙනකුගෙන් අධ්‍යයන නියැදිය සමන්විත විය. මෙහි දී දත්ත රැස් කිරීමට ප්‍රධාන වශයෙන් ම නිරීක්ෂණ පත්‍රිකා යොදා ගැනිණි. ඊට අමතරව විදුහල්පති, ගුරු උපදේශක, ගුරුවරුන් සඳහා වන ප්‍රශ්නාවලි හා ගුරු, විදුහල්පති සම්මුඛ සාකච්ඡා මගින් ද දත්ත රැස් කර ගැනුණි. එසේ ම ඉගෙනුම් ද්‍රව්‍ය, අදාළ චක්‍රලේඛ, පෙළපොත්, ගුරු උපදෙස් සංග්‍රහ, ප්‍රාග්ධන හා පාරිභෝගික ගුණාත්මක භාණ්ඩ, ක්‍රියාකාරකම් කාමරය වැනි දෑ ද නිරීක්ෂණය කරන ලදි.

ප්‍රධාන අරමුණුවලට අදාළ ව දත්ත විශ්ලේෂණය ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රවේශ දෙකෙහි සංකලනයෙන් සිදු කරන ලදි. පාසල් 5හි සිදු කරන ලද ප්‍රත්‍යෙක අධ්‍යයන 5 හරහා සසඳමින් අනාවරණ දක්වා ඇත. ඒ අනුව නියැදියට අදාළ කිසිදු ගුරුවරයෙක් හෝ විදුහල්පතිවරයෙක් පරිණාමන ගුරු භූමිකාව පිළිබඳ ව නොදන්නා බව අනාවරණය විය. ගුරු ක්‍රියාකාරිත්වයෙහි සතුටුදායක නොවූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද රැසක් ද අනාවරණය විය. බහුතරයක් ගුරුවරුන් ළඟ විධිමත් සූදානම් සටහනක් නොවුණි. ක්‍රියාකාරකම්වල දී සිසුන් අතර ගැවසෙමින් අවශ්‍ය උපදෙස් හා ප්‍රතිපෝෂණ ලබා දීම දක්නට ලැබුණි. නමුත් කාල කළමනාකරණය අසතුටුදායක මට්ටමින් පැවතුණි. විෂයය මෙන්

ම ගුරු භූමිකාවද ක්‍රියාත්මක කිරීමට උපදෙස් දී ඇත්තේ ගවේෂණය පදනම් කොටගෙන වුව ද, පන්තිකාමරය තුළ බහුලව අසුන්ගත ක්‍රියාකාරකම්වලට වැඩි අවධානයක් යොමු කළ අතර එළිමහන් පරිසරය භාවිත කළේ මඳ වශයෙනි. පාසල් පිරියත අවාසිදායක මට්ටමේ පැවතිය ද, 1සී වර්ගයේ පාසල් විෂයය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගන්නා බව අනාවරණය විය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරු සුසාධ්‍යකරණයේ ස්වභාවය සෙවීම හා තවදුරටත් විෂයය හා ගුරු භූමිකාව සාර්ථක කර ගැනීමට ගුරුවරයාට අවශ්‍ය වන්නේ කවර සහයෝගයක් ද යන්න සෙවීම සඳහා සහයෝගී ඉගැන්වීමක පර්යේෂිකාව නිරත විය. මෙහි දී පර්යේෂිකාව, වාණිජ්‍යවේදී උපාධිධාරී ගුරුතුමිය හා සම්බන්ධව ගෘහ විද්‍යා පාඩමක් ද, ගෘහ විද්‍යා පුහුණු ගුරුතුමිය හා සම්බන්ධව වාණිජ්‍ය පාඩමක් ද සහයෝගී ඉගැන්වීම යටතේ සිදුකරන ලදී. අදාළ පාඩම ගවේෂණය මත සැලසුම් කිරීම, ඒ සම්බන්ධ කාල කළමනාකරණය, පාඩම සමාලෝචනය තුළ විෂයය කරුණු පැහැදිලිව හා නිශ්චිත ව සිසුනට කියා දීම ආදී උදවු ගුරුවරුනට අවශ්‍ය වන බව අනාවරණය විය.

පෙළපොත ඉගෙනුම් උපකරණයක්, අතිරේක කියවීමක් ලෙස ගෙන ගුරු අත්පොත මනා ලෙස පරිහරණය කරමින් පාඩම සැලසුමට, කාල කළමනාකරණයට, විෂයය කරුණුවලින් සිසුන් පෝෂණයට පර්යේෂිකාව සහයෝගය ලබා දුනි. විෂයය සම්බන්ධව පාඩම් සැලසුමට පදනම සකසා ගත යුත්තේ විෂයය නිර්දේශය හා ගුරු අත්පොත මනා ලෙස පරිශීලනය කරමින් බවත්, පෙළපොත අතිරේකව සිසු දැනුම වර්ධනයට ප්‍රයෝජනවත් බවත් පිළිගනිමින් ගුරුවරුන් සහයෝගී ඉගැන්වීම අගය කළහ.

සහයෝගී ඉගැන්වීම තුළ විෂයය භාර ගුරුතුමිය වඩාත් විශ්වාසයකින්, තෘප්තියකින් හා ගුරු පෞරුෂයකින් යුතුව පාඩම සමාලෝචනය කරනු පෙනුණි.

මෙම අධ්‍යයන අනාවරණ අනුව ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂයය සංවර්ධනය කිරීමට ගුරු ක්‍රියාකාරීත්වයෙහි වැඩි දියුණුවිය යුතු අංග ගණනාවක් ම පෙනී යයි. එහි දී, විදුහල්පති, ගුරු උපදේශක හා සම්පත් පුද්ගල දායකත්වය අත්‍යවශ්‍ය විෂයයක් බව නිගමනය විය. ගුරු පුහුණු වැඩ සටහන්, සේවාස්ථ සැසි කොතෙක් පැවැත්වුව ද එහි ඵලදායී බව අවම මට්ටමක පවතින බව නිගමනය විය. මේ නිසා ඉගැන්වීමට අවශ්‍ය සමීප සහයෝගය ලබා දීම, විෂයය මෙන් ම ගුරු භූමිකාව නංවාලීම වඩාත් ඵලදායී බව නිගමනය විය. මෙම නිගමනවලට අනුව

- ශ්‍රී ලංකාවේ ආණ්ඩු වෙනස්වීමත් සමඟ මෙම තාක්ෂණික විෂයයන්වල වෙනස්වීම් නොකළ යුතු බවටත් ඒ සඳහා කළයුතු වන්නේ මෙම විෂයයන් පාසල්වල සංවර්ධනය කිරීම සඳහා පියවර ගැනීම කළයුතු බවටත්

- පාසල තුළ පවතින භෞතික හා මානව සම්පත් ඵලදායිවන අයුරින් කළමනාකරණය කරගන්නා ආකාරය පිළිබඳ නිසි නියාමනයක් සිදු කළ යුතු බවටත්
- විෂය මෙන්ම ගුරුභූමිකාවේ සාර්ථකත්වය පාසල් පද්ධතියතුළ පවත්වාගෙන යාම සඳහා විෂයයෙහි වටිනාකම පිළිබඳ ව විදුහල්පති නියෝජ්‍ය විදුහල්පති අංශභාර ගුරුභවතුන් මනා ලෙස දැනුවත් කළ යුතු බවටත්

යෝජනා ඉදිරිපත් කර ඇත.

තවද පාසල තුළ විෂයය දියුණු කිරීමට ක්‍රියාමූලික පර්යේෂණයන්ට යොමුවීම හා ගුණාත්මකව සිදුකර ඇති මෙම පර්යේෂණ අධ්‍යයනයේ අනාවරණවලට සමගාමීව සමස්ත පද්ධතිය පුරාම විෂය ක්‍රියාත්මක වන්නේදැයි ප්‍රමාණාත්මකව බැලීමට සමීක්ෂණක් සිදුකළ හැකි බවටද අනාගත පර්යේෂණ කාර්යයේ යෙදෙන්නන්ට යෝජනා ඉදිරිපත්කර ඇත.

# Summary

The main objective of this research is to inquire on the transformative role of the teacher in relation to the junior secondary curriculum subject Practical and Technological Skills. Practical and Technological Skills subject contribute greatly to the development of social and common skills. The historical background to the development of this subject revealed the need for this subject in the junior secondary curriculum.

The importance of role of the teacher is very high in competency-based education. When introducing the subject Practical and Technological Skills to the system with the objective of expected skills and competencies to the children, the teachers are faced with various challenges and difficulties in teaching-learning process with the application of transformative teacher role.

The objectives of the study were to inquire in to the teachers' knowledge on the transformative role, the challenges faced by them, the support needed from perform the principals and In-service Advisors to perform the transformative role.

In order to achieve the objectives stated above, multiple case study was used as a research method. Five schools under the categories of National schools, 1AB, 1C and Type 2 of the Borella Education Division in Colombo Zone were selected as the school sample. The sample of principals included principals of respective schools, 3 In-service Advisors of Practical and Technological Skills subject and 2 teachers from each school (in total 10) who teach the particular subject in Grade 7.

Observations on teaching-learning situations, questionnaire given to principals, in-service advisors, teachers and by the interviews with principals and teachers were the data collection methods. Learning materials, circulars, text books, teachers' guides, quality inputs, consumer goods and activity rooms were observed accordingly.

Quantitative and qualitative data analysis methods were used. The 5 case studies of five schools were cross analysed. It was revealed that neither a principal nor a teacher concerned in the sample was aware of the transformative teacher role.

Teaching methods adopted were at an unsatisfactory level. Majority of teachers lacked proper lesson planning skills and time management too was unsatisfactory.

Although the subject needed the role of the teacher to implement lessons in 'Exploration' the more emphasis was towards desk work. Less attention was paid on the use of the environment.

Further, although the school premises and environment wasn't very resourceful in all schools, the 1C school had made a great effort to implement the subject to a certain level of satisfaction.

To find out the nature of the teacher as a facilitator in the teaching-learning process and how to achieve the success of teacher's role were studied and done under collaborative teaching. It was observed that teachers needed help to plan lessons, to implement with 'exploration', to improve time management skills and to improve skills to explain the facts of the lesson clearly. Teachers were also assisted by the researcher to use the text book and the teachers' guide effectively in planning the lessons. Collaborative teaching was highly appreciated by the teachers. They acknowledged that text book as a source of extra knowledge.

The outcome of the study brought out some aspects of teaching process that needed to be improved in teacher's role. It was concluded that the contribution expected from the principals, in-service advisors and resource persons in this regard is essential.

Although, number of seminars, teacher training programmes have been conducted the effectiveness of those are questionable. Therefore, close assistance is needed for teaching and the upliftment of teachers' role. According to the study the suggestions are presented to develop the quality of teaching-learning process through improving teacher training, improving awareness in principals and ISAs.